# අය වැය ලේඛනය
# 2015



## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

# 2015 වර්ෂය සඳහා වූ
# මෙම අයවැය වාර්තාව

අඟුණකොලපැලැස්ස

ප්‍රාදේශීය සභාවේ

2014.11.25 දින

මහා සභා රැස්වීමේදී

තීරණ අංක 8:6 යටතේ

සභා සම්මත කරන ලදි.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | දර්ශනය හා මෙහෙවර ප්‍රකාශනය | 1 |
| 02. | සභාපතිතුමාගේ පණිවුඩය | 2 |
| 03. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය -සිතියම | 3 |
| 04. | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හැඳින්වීම | 4 |
| 05. | බල ප්‍රදේශයේ මූලික තොරතුරු | 6 |
| 06. | බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරී වසම් | 7 |
| 07. | බල ප්‍රදේශයේ මාර්ග තොරතුරු | 9 |
| 08. | පොලිස් බල ප්‍රදේශ අනුව ග්‍රාම නිළධාරී වසම් | 10 |
| 09. | ප්‍රාදේශීය සභාවේ සගික තොරතුරු | 12 |
| 10. | සම්බන්ධීකරණ තොරතුරු | 13 |
| 11. | සංවිධාන ව්‍යුහය | 14 |
| 12. | සේවක සංඛ්‍යා තොරතුරු | 15 |
| 13. | ආයතනය යටතේ පාලනය වන භෞතික සම්පත් සහ ආයතන | 16 |
| 14. | සභාව සතු රථ වාහන | 17 |
| 15. | පෙර වසරවල මූල්‍ය විශ්ලේෂණය | 18 |
| 16. | 2015 වර්ෂයේ අයවැය සාරාංශ | 22 |
| 17. | 2015 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සාරාංශය | 23 |
| 18. | 2015 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සාරාංශය | 24 |
| 19. | වැඩසටහන් විස්තරය | |
| | වැඩසටහන් අංක 1 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 25 |
| | වැඩසටහන් අංක 2 - සෞඛ්‍ය සේවා | 27 |
| | වැඩසටහන් අංක 3 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | 28 |
| | වැඩසටහන් අංක 5 - මහජන උපයෝගි සේවා | 29 |
| | වැඩසටහන් අංක 6 - සුභසාධක හා විහරණ සේවා | 30 |

| | | |
|---|---|---|
| 20. | වැඩසටහන් අංක 1 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | |
| | 1. ආදායම් ප්‍රභවයන් | 31 |
| | 2. ආදායම් ඇස්තමේන්තු | 33 |
| | 3. වියදම් ඇස්තමේන්තු | 34 |
| 21. | වැඩසටහන් අංක 2 - සෞඛ්‍ය සේවා | |
| | 1. ආදායම් ප්‍රභවයන් | 36 |
| | 2. ආදායම් ඇස්තමේන්තු | 39 |
| | 3. වියදම් ඇස්තමේන්තු | 40 |
| 22. | වැඩසටහන් අංක 3 - භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි | |
| | 1. ආදායම් ප්‍රභවයන් | 41 |
| | 2. ආදායම් ඇස්තමේන්තු | 43 |
| | 3. වියදම් ඇස්තමේන්තු | 44 |
| 23. | වැඩසටහන් අංක 5 - මහජන උපයෝගි සේවා | |
| | 1. ආදායම් ප්‍රභවයන් | 45 |
| | 2. ආදායම් ඇස්තමේන්තු | 46 |
| | 3. වියදම් ඇස්තමේන්තු | 47 |
| 24. | වැඩසටහන් අංක 6 - සුභසාධන හා විහරණ සේවා | |
| | 1. ආදායම් ප්‍රභවයන් | 48 |
| | 2. ආදායම් ඇස්තමේන්තු | 49 |
| | 3. වියදම් ඇස්තමේන්තු | 50 |
| 25. | 2015 ප්‍රාග්ධන ආදායම් ඇස්තමේන්තු | 51 |
| 26. | 2015 ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු | 52 |
| 27. | සභා අරමුදල් වැය විස්තරය 2015 | 53 |



# අපගේ දැක්ම

ප්‍රජා නායකත්වය හා ප්‍රජා දායකත්වය සාර්ථකත්වයේ යදමක් කර ගනිමු.

# OUR VISION

Let's make the community leadership and community contribution the strong base of th success.

# අපගේ මෙහෙවර

සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභවාදී ආකල්ප මත, සුභ සාධනයේ හා සංවර්ධනයේ සමායෝජනයෙන් ඵලදායි හා ස්ථායීකරණ ආර්ථිකයක් කරා යාමට නිරන්තර දායකත්වය හා කැපවීම අපගේ මෙහෙවරයි!

# OUR MISSION

Our mission is to provide constant contribution and dedication to achieve an effective an stable economy through the coordination of welfare and development based on positive attitudes of the people living in the area of Pradeshiya Sabha.

## ගරු සභාපතිතුමාගේ පණිවුඩය



අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනාගත අභිවෘද්ධිය, පුනර්ජීවය වෙනුවෙන් අඟුණකොළපැලැස්ස බල ප්‍රදේශයේ සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව ජනතා මෙහෙවරට ඇපකැප වී කටයුතු කරන්නේ බල ප්‍රදේශයේ ජනතාවගේ හෙට දිනය ආලෝකමත් කිරීමේ ඒකායන අධිෂ්ඨානය.

එකී අරමුණු පෙරදැරිව සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික යන සෑම අංශයක්ම සමබරව සංවර්ධනය කරමින්අනාගතයේදී නව නවත් නිර්මාණශීලී ඉදිරි දැක්මකින් නොනිමි ජාතික මෙහෙවරක් උදෙසා 2015 වර්ෂයේ සංවර්ධන සහ මෙහෙයුම් සැලැස්ම සකස් කර ඇත. ඒ සඳහා යෝධ ශක්තියක් වෙමින් බල ප්‍රදේශයේ සංවර්ධනය තුළින් ආශ්චර්යමත් දේශයක් කරා යන ගමනට අත්වැලක්වීම අපගේ උත්සාහයයි. අප යන මෙම දුෂ්කර ගමනේදී මෙතෙක් මා සමඟ අත්වැල් බැඳ සපැමිණි ඔබ සැමගේ නොමසුරු සහභාගිත්වයත්, දිරිමත් කිරීමත් විශේෂයෙන්ම බලාපොරොත්තු වෙමු.

අප සතුව පවත්නා අතිශය සීමිත වූ සම්පත් උපයෝගී කර ගනිමින් සියලු ජනතාවගේ පැතුමන් කිසිවෙකුට අසාධාරණයක් නොවන අයුරින් පෙළ ගස්වා ක්‍රියාත්මක කිරීමට ඔබ සියලු දෙනාගේ විචක්ෂණශීලී සාධාරණ චින්තනය අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත. අපෙන් ඔබට සහ ඔබෙන් අපට ලැබෙන දේ මෙන්ම, ලැබිය යුතු දේත්, ලබාගත හැකි දේත් සලකා බලා ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් ඒකාත්මික වීම යුගයේ අවශ්‍යතාවයකි. මෙම තත්වයන් තේරුම් ගනිමින් අප සියල්ලන් අත්වැල් බැඳගැනීම අපගේ නිෂ්ඨාව වෙත ගමන් කරන කෙටිම මාර්ගය බව මාගේ අදහසයි. එය වාර්ෂික අයවැය මඟින් ඉදිරිපත් කරන රුපියල් ශතවලට වඩා ශක්තිමත්, ප්‍රභලතම හා සම්පත වේ.

ඔබ සැමට සුභ අනාගතයක් !

එම්. විජේරත්න
සභාපති,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

# ANGUNAKOLAPELESSA

## PRADESHIYA SABHA AREA





HAMBANTOTA
DISTRICT



# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

## හැඳින්වීම

### පිහිටීම

දක්ෂිණ ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා ඇත. අක්ෂාංශ හා දේශාංශ පිහිටීම අනුව උතුරු අක්ෂාංශ $6^0$ 9' 51'' සහ නැගෙනහිර දේශාංෂ $80^0$53'53'' අතර පිහිටා ඇති අතර නැගෙනහිර දිශාව අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාවෙන්ද , දකුණු දිශාවට තංගල්ල ප්‍රාදේශීය සභා සීමාවෙන්ද උතුරු දිශාවට රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවෙන්ද, බටහිර දිශාවට වීරකැටිය හා කටුවන ප්‍රාදේශීය සභා සීමාවෙන්ද මායිම් වේ.

සිංහල රාජ සමය තරා දිවයන අතීතයකට උරුමකම් කියන මෙම බල ප්‍රදේශය සොබා දහමින් ලත් අපූර්වත්වයද එක් කරගනිමින් වර්තමානය වන විට ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා ආගමික අංග වලින් පොහොසත්ව සංවර්ධනයේ ඉලක්ක සපුරා ගනිමින් සිටිනා රටට බත සපයන වී බිස්සක් ලෙස අඟුණකොළපැලැස්ස පුරවරය හැඳින්විය හැක.

ග්‍රාම සේවා වසම් 51කින්(ගම් 108කි) සමන්විත මෙම බල ප්‍රදේශයේ විශාලත්වය වර්ග කි.මී.167.73ක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් 6.8%)වන අතර ජනගහනය 47409කි.

භෞතික පිහිටීම අනුව මෙම බල ප්‍රදේශයේ මුළු මනින්ම වාගේ තැනිතලා ස්වභාවයක් පෙන්නුම් කෙරේ. මෙම බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ වෙරළබඩ සිට මදක් අභ්‍යන්තරයේ පිහිටා ඇත. පොදුවේ තැනිතලා ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි වුවද බල ප්‍රදේශයේ දකුණු හා බටහිර කොටස් වල බොහෝ දුරට දක්නට ලැබෙන්නේ රැලි බිම් ස්වභාවයකි. උතුරු ප්‍රදේශයේ ඇති රැලි බිම් ප්‍රදේශය තුළ කුඩා ප්‍රමාණයේ කඳුගැට කිහිපයක්ද දක්නට ලැබෙන අතර, අඩි 799ක් උසැති කපරුල්ල කන්ද උසම ස්ථානය වේ.

රතු දුඹුරු පස් හා දියළු පස ප්‍රදේශයේ ප්‍රධානතම පස් කාණ්ඩ අතරට අයත් වේ. සමහර ප්‍රදේශ වල සුළු වශයෙන් තිරුවනා නිධි දක්නට ලැබේ. සුළු වශයෙන් කළු ගල් නිධි ද පිහිට ඇති අතර ඒ අනුව තිරුවනා, කළු ගල් හා මැටි මෙහි ඇති ප්‍රධානතම ඛනිජ සම්පත් වේ.

ශුෂ්ක ප්‍රදේශයේ සිට තෙත් කලාපය දක්වා විවිධත්වයක් ගන්නා දේශගුණික කලාපයකට අයත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වියලි කලාපීය දේශගුණික රටාවකට උරුමකම් කියයි.

දීප්තිමත් සූර්යලෝකයක් සහිත මෙම ප්‍රදේශයේ වාතයේ ආර්ද්‍රතාවය ඉතා ඉහළ මට්ටමක පවතී. මාර්තු, අප්‍රේල්, අගෝස්තු හා සැප්තැම්බර් යන මස වල ඉතා තදින් සූර්යාලෝකය පවතින අතර එම මාස වලදී අධික උෂ්ණත්වයක් පවතී. දෙසැම්බර්, ජනවාරි මාසවලදී උෂ්ණත්වය පහල යාමක් දක්නට ලැබේ. ඒ අනුව හිරු රැස් තදින් පතිත වන කාලයේ සාමාන්‍ය මාසික උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 31.1ක් පමණ වන අතර දෙසැම්බර්, ජනවාරි වන විට එය සෙන්ටිග්‍රේට් අංශක 22.7ක් දක්වා පහල බසී.

අතීතයේ පෙර රජදරුවන්ගේ ඇල්ම බැල්ම මත ඉදි වූ ඓතිහාසික සිද්ධස්ථාන බල ප්‍රදේශයේ ගැමි ජනතාවගේ අධ්‍යාත්මික ගුණ වගාව වැඩි දියුණු කිරීමට ඉවහල් වී ඇත. ඒ අතුරින් ඓතිහාසික වටිනාකම් වලින් යුත් සිද්ධස්ථාන අතුරින් ප්‍රධාන ස්ථානය ගෙන ඇත්තේ බෞද්ධයාගේ මුදුන් මල්කඩක් බඳු දන්ත ධාතුන් වහන්සේ ස්පර්ශය ලද කසාගල රජමහා විහාරයයි. නුවර යුගයට අයත් වන මෙම විහාරස්ථානයේ පැරණි

විහාරයේ ඇති බිතු සිතුවම් කෙරෙහි වර්තමානයේ දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේත් නෙත් සිත් යොමු වී ඇත.

කෘෂිකාර්මික ජීවන රටාවකට හිමිකම් කියන මෙම බල ප්‍රදේශයේ වැවයි දාගැබයි කෙතයි කේන්ද්‍ර කොට ගනිමින් ගම්මාන බිහි වී ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වැව් රාශියක් පිහිටා ඇති අතර, සියපතින් සුසැදි මනරම් වැව් ප්‍රදේශයට සෞන්දර්යයත්, සිසිලසත් මෙන්ම කෘෂිකර්මාන්තයේ දියුණුවට ද ඉවහල් වේ. බලප්‍රදේශයේ පිහිටි වැව් අතරින් විශාලම වැව මැටිගත්වල වැවයි. එකිනෙක බැඳී තිබූ වැව් පද්ධති මගින් අතීතයේදී කෙත්වතු පෝෂණය කල අතර අඩ සියවසක සිට වලවේ, මහවැලි ජලය හා මුරුතවෙල ආදී ව්‍යාපර වලින් කෙත්වතු සරු සාර කරනු ලබයි.

අතීතයේ සිටම වී වගාව, හේන් ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කරගත් ජනතාව එතැකින් සීමා නොවී වෙනත් බෝග වගාවන්ට මෙන්ම සත්ව පාලදනයටද හුරු වී ඇත.

ඒ අනුව පළතුරු වගාව, එළවළු වගාවද මෙම බල ප්‍රදේශයේ බහුලව දක්නට ලැබේ. වම්බටු, වැටකොළු, පතෝල, කරවිල, බටු, මිරිස්, බණ්ඩක්කා හා මෑ කරල් ඇතුළු බොහෝ එළවළු වර්ග සහ කෙසෙල්, අඹ, දිවුල්, දෙළුම්, බෙලි,ගස්ලබු වැනි බොහෝ පළතුරු වර්ගද මෙම ප්‍රදේශය තුළ බහුල වේ.

මීට අමතරව රසයෙන් ගුණයෙන් වැඩි මී කිරි නිෂ්පාදනයද තවත් බොහෝ පිරිසකගේ ජීවනෝපාය මාර්ගය වී ඇත.

මෑත කාලය වන විට බොහෝ ජීවන මාර්ග බිහි වී තිබුණද අතීතයේ පැවති කුරහන් සුවඳ ගැමි හදවත් තුල තවමත් බැහැර වී නැත. මෙම ප්‍රදේශයේ හේන් ගොවිතැනටද ඇළුම් කරන බොහෝ පිරිසක් වර්තමානයේද සිටින බැවින් කුරහන්, බඩ ඉරිඟු, තල වැනි ධාන්‍ය වර්ගද බහුලව ඇත.

ස්වයං රැකියාව තම ජීවනෝපාය මාර්ගය කරගත් බොහෝ දෙනා කොහු කර්මාන්තය, ඉදල් කර්මාන්තය වැනි ක්ෂේත්‍ර වලද නියැලී සිටී.

තාක්ෂණයේ දියුණුවත් සමඟ අනාගත ලෝකයට පා තබන්නට සැරසෙන පුංචි මල් කැකුළු වන් ළමා පරපුර ද අධ්‍යාත්මික ගුණ වගාවෙන් හා අධ්‍යාපන , සෞන්දර්යය, ක්‍රීඩා කෞශල්‍ය වලින් පරිපූර්ණ වීම බල ප්‍රදේශයේ භාග්‍යකි.

සොබා දහමේ ආශිර්වාදයත් සමඟ ලත් සොබා සෞන්දර්යය හා සිසිලසත්, ගොවියාගේ දහදියත් මුසුව හෙට දිනයේ අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සශ්‍රීකත්වයෙන් හා සංවර්ධනයෙන් ඉදිරියට යනු නොඅනුමානය,

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මූලික තොරතුරු

❖ දිස්ත්‍රික්කය - හම්බන්තොට .

❖ මැතිවරණ කොට්ඨාශය - හම්බන්තොට

❖ ජන්ද කොට්ඨාසය - තංගල්ල

❖ පළාත් පාලන ආයතනය - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව

❖ කුඩා ගම්මාන - 108

❖ ග්‍රාම නිලධාරී වසම් - 51

❖ විශාලත්වය - වර්ග කිලෝ මීටර් 167.73

❖ වාර්ෂික වර්ෂාපතනය - මිලි මීටර් 50 - 75

❖ වාර්ෂික උෂ්ණත්වය - සෙල්සියස් අංශක 26 -31

❖ පොලිස් බල ප්‍රදේශ - අඟුණකොළපැලැස්ස, මිද්දෙනිය, වීරකැටිය, හුංගම

❖ ගොවිජන කේන්ද්‍ර - අඟුණකොළපැලැස්ස, උඩයාල

❖ රෝහල් - අඟුණකොළපැලැස්ස, කාරියමඩිත්ත, හකුරුවෙල

❖ මධ්‍යම බෙහෙත් ශාලා - අඹේසේකරගම

❖ පාසල් - 23

❖ පෙර පාසල් - 40 (සභාව විසින් පාලනය කෙරෙන පෙර පාසල් 2කි)

❖ දහම් පාසල් - 30

❖ විහාරස්ථාන - 36

❖ හදිසි මරණ පරීක්ෂක කොට්ඨාශ - 2

❖ බැංකු - 10

❖ තැපැල් කාර්යාල - 04

❖ ප්‍රජාශාලා - 68

❖ ක්‍රීඩා පිටි - 26

❖ වැව් - 105

## ග්‍රාම නිළධාරී වසම්

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරී වසම් හා ඊට අයත් ගම්මාන පහත දක්වා ඇත.

| අනු අංකය | වසම් අංකය | වසමේ නම | ගම්මාන ගණන | ගම්වල නම් |
|---|---|---|---|---|
| .01 | 187 | අඟුණකොළපැලැස්ස | 02 | හැඩකැටිය ,අඟුණකොළපැලැස්ස |
| 02 | 188 | ආචාරියගම | 01 | ආචාරියගම |
| 03 | 189 | යකාගල | 01 | යකාගල |
| 04 | 190 | අළුත්වැව | 01 | අළුත්වැව |
| 05 | 191 | කංකානම්ගම | 02 | කංකානම්ගම , මුලනගොඩ |
| 06 | 192 | බිංකම | 02 | බිංකම, හිංආර |
| 07 | 193 | හැලේකඩ | 03 | හැලේකඩ/දකුණ, කරගහවලින් (කොටසක්) |
| 08 | 194 | දංදෙනිගම | 03 | හැලේකඩ,දංදෙනිගම,කුලසිංගම,පලුගහවල |
| 09 | 195 | කරගහවල | 02 | කරගහවල, සියඹලාගස්වැව |
| 10 | 196 | ජුලමුල්ල | 03 | ජුලමුල්ල, දෙපැලමුල්ල, තුප්පහිගම |
| 11 | 197 | ජඳුර | 03 | ජඳුර , හින්දගම, තුප්පහිගම (කොටසක්) |
| 12 | 198 | පහලගම | 05 | පහලගම, තෙරුන්ගම, මාගම්යාගම,<br>මනම්පේරිගම, කුලසිංගම |
| 13 | 199 | ගුරුවල | 03 | ඉහළගුරුවල, පහළගුරුවල,<br>දංදෙනිගම(කොටසක්) |
| 14 | 200 | ඉඳිගැටවෙල | 02 | ඉඳිගැටවෙල, තලම්පෝරුව(කොටසක්) |
| 15 | 201 | තලම්පෝරුව | 02 | තලම්පෝරුව , දික්කුඹුර |
| 16 | 202 | ගුරුන්නැහේගෙආර | 02 | ගුරුන්නැහෙගෙආර, ගෝඩයිම්බරගම |
| 17 | 203 | දහඅමුණ | 02 | දහඅමුණ, 18 කොළණිය |
| 18 | 204 | කොටවාය | 03 | කොටවාය, පිංවැව, දහඅමුණ(කොටසක්) |
| 19 | 205 | හකුරුවෙල | 02 | හකුරුවෙල, මොදරමොටාවිල |
| 20 | 206 | නෙවොලපෝරුව | 01 | නෙවොලපෝරුව |
| 21 | 207 | උඩයාල | 03 | උඩයාල, හුන්නකුඹුර, ඇතිනිගම්වල |
| 22 | 208 | මැදයාල | 02 | මැදයාල, හුන්නකුඹුර(කොටසක්) |
| 23 | 209 | බෝගමුව | 02 | බෝගමුව, ලග්ගමුව |
| 24 | 210 | වීරගස්වැව | 03 | වීරගස්වැව, ලියන්කටුව, දූන්හේන්ආර |
| 25 | 211 | හින්බුන්න | 02 | හින්බුන්න, හින්ආර |
| 26 | 212 | මකුලදෙනිය | 02 | මකුලදෙනිය, හින්බුන්න(කොටසක්) |
| 27 | 213 | මැදගොඩ | 02 | කුඹුක්මුල්ල, මැදගොඩ |
| 28 | 214 | දිඹුල්ගොඩ | 01 | දිඹුල්ගොඩ |

| අනු අංකය | වසම් අංකය | වසමේ නම | ගම්මාන ගණන | ගම්වල නම් |
|---|---|---|---|---|
| 29 | 215 | ගජනායකගම | 05 | ගජනායකගම, පිල්ලවෙල, මරක්කලයාගම, ගමඇතිගම, වේහැලිගම |
| 30 | 216 | වකමුල්ල | 02 | ඉහල වකමුල්ල, පහල වකමුල්ල |
| 31 | 217 | අත්තනයාල බටහිර | 01 | අත්තනයාල / බටහිර |
| 32 | 218 | අත්තනයාල / නැ | 02 | අත්තනයාල, පංගම්විල |
| 33 | 219 | දෙබොක්කාව උතුර | 01 | දෙබොක්කාව / උතුර කොටස |
| 34 | 220 | දෙබොක්කාව දකුණ | 01 | දෙබොක්කාව / දකුණ කොටස |
| 35 | 221 | සූරියපොකුණ | 04 | සූරියපොකුණ,කරගහවල, බැද්දෙවැව,බුවැලි ආර |
| 36 | 222 | අමරතුංගම | 03 | අමරතුංගම, විජේසිංගම, අතපත්තුගම |
| 37 | 223 | මැදආර | 01 | මැදආර |
| 38 | 224 | කොහොඹගස්වැව | 02 | කොහොඹගස්වැව, ගල්වැව |
| 39 | 225 | උස්වැව | 01 | උස්වැව |
| 40 | 226 | කයිලවැල්පෝටාව | 01 | කයිලවැල්පෝටාව |
| 41 | 227 | මැටිගත්වල | 02 | තෝරගල, මැටිගත්වල |
| 42 | 228 | අබේසේකරගම | 01 | අබේසේකරගම |
| 43 | 229 | දික්වැව | 02 | දික්වැව, වරායාය |
| 44 | 230 | කලවැල්වල | 01 | කලවැල්වල |
| 45 | 231 | කැන්දකැටිය | 02 | ඉහළ කැන්දකැටිය, කිවුල |
| 46 | 232 | රත්මල්වල | 03 | රත්මල්වල, කච්චිගල, තඹලපැලැස්ස |
| 47 | 233 | දබරැල්ල උතුර | 03 | දබරැල්ල(කොටසක්), ගලගාවගොඩ, වෙලගාවවතුගොඩ |
| 48 | 234 | දබරැල්ල දකුණ | 02 | දබරැල්ල(කොටසක්), කරමැටිය |
| 49 | 235 | කරමැටිය | 01 | කාරියමඩිත්ත |
| 50 | 236 | තලාව උතුර | 04 | අළුත්වැවගොඩ, වරණසිංගොඩ, මහළිඳගොඩ, තලාව(කොටසක්) |
| 51 | 237 | තලාව දකුණ | 05 | විරෝධාගම, කළුවරගස්යාය, සමරසිංගොඩ, වැලිනගේවෙල, තලාව(කොටසක්) |

<u>අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග තොරතුරු</u>

| අනු අංකය | වර්ගීකරණය | මාර්ගයේ නම | දුර කි. මී |
|---|---|---|---|
| 01 | මාර්ග සංවර්ධන අධිකාරිය | රන්න අඟුණකොළ වැටිය මාර්ගය | 16 .6 |
| 02 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | හුංගම මිද්දෙණිය මාර්ගය | 24. 6 |
| 03 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | තලාව දබරැල්ල මාර්ගය | 6. 0 |
| 04 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | දෙබොක්කාව වීරකැටිය මැදමුලන මාර්ගය | 6. 5 |
| 05 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | කලවැල්වල කච්චිගල්ආර අබේසේකරගම ඇඹිලිපිටිය මාර්ගය | 4. 9 |
| 06 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | අළුත්වැව උඩයාල වීරකැටිය මාර්ගය | 18. 4 |
| 07 | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | බිංකම රත්මල්වල මාර්ගය | 15. 3 |
| 08 | ප්‍රාදේශීය සභා මාර්ග | | 493 |

පොලිස් බල ප්‍රදේශය අනුව ග්‍රාම නිලධාරී වසම්

| වසම් අංකය | වසමේ නම | පොලිස් බල ප්‍රදේශය |
|---|---|---|
| 187 | අඟුණකොළපැලැස්ස | අඟුණකොළපැලැස්ස |
| 188 | ආචාරියගම | අඟුණකොළපැලැස්ස |
| 189 | යකාගල | අඟුණකොළපැලැස්ස |
| 190 | අළුත්වැව | අඟුණකොළපැලැස්ස |
| 191 | කංකානම්ගම | අඟුණකොළපැලැස්ස |
| 192 | බිංකම | අඟුණකොළපැලැස්ස |
| 193 | හැලේකඩ | අඟුණකොළපැලැස්ස |
| 194 | දංදෙණිගම | අඟුණකොළපැලැස්ස |
| 195 | කරගහවල | අඟුණකොළපැලැස්ස |
| 196 | ජුලමුල්ල | අඟුණකොළපැලැස්ස |
| 197 | ජඳුර | අඟුණකොළපැලැස්ස |
| 198 | පහලගම | අඟුණකොළපැලැස්ස |
| 199 | ගුරුවල | අඟුණකොළපැලැස්ස |
| 200 | ඉඳිගැටවෙල | හුංගම |
| 201 | තලම්පෝරුව | හුංගම |
| 202 | ගුරුන්නැහේගෙආර | හුංගම |
| 203 | දහඅමුණ | හුංගම |
| 204 | කොටවාය | හුංගම |
| 205 | හකුරුවෙල | විරකැටිය |
| 206 | නෙටොලපෝරුව | විරකැටිය |
| 207 | උඩයාල | විරකැටිය |
| 208 | මැදයාල | විරකැටිය |
| 209 | බෝගමුව | විරකැටිය |
| 210 | විරගස්වැව | විරකැටිය |
| 211 | හින්බුන්න | විරකැටිය |
| 212 | මකුලදෙනිය | විරකැටිය |
| 213 | මැදගොඩ | විරකැටිය |
| 214 | දිඹුල්ගොඩ | විරකැටිය |
| 215 | ගජනායකගම | විරකැටිය |
| 216 | වකමුල්ල | විරකැටිය |

| වසම් අංකය | වසමේ නම | පොලිස් බල ප්‍රදේශය |
|---|---|---|
| 217 | අත්තනයාල බටහිර | විරකැටිය |
| 218 | අත්තනයාල / නැ | විරකැටිය |
| 219 | දෙබොක්කාව උතුර | මිද්දෙණිය |
| 220 | දෙබොක්කාව දකුණ | මිද්දෙණිය |
| 221 | සූරියපොකුණ | මිද්දෙණිය |
| 222 | අමරතුංගම | අඟුණකොළපැලැස්ස |
| 223 | මැදආර | අඟුණකොළපැලැස්ස |
| 224 | කොහොඹගස්වැව | අඟුණකොළපැලැස්ස |
| 225 | උස්වැව | අඟුණකොළපැලැස්ස |
| 226 | කයිලවැල්පෝටාව | අඟුණකොළපැලැස්ස |
| 227 | මැටිගත්වල | අඟුණකොළපැලැස්ස |
| 228 | අබේසේකරගම | අඟුණකොළපැලැස්ස |
| 229 | දික්වැව | අඟුණකොළපැලැස්ස |
| 230 | කලවැල්වල | අඟුණකොළපැලැස්ස |
| 231 | කැන්දකැටිය | මිද්දෙණිය |
| 232 | රත්මල්වල | මිද්දෙණිය |
| 233 | දබරැල්ල උතුර | මිද්දෙණිය |
| 234 | දබරැල්ල දකුණ | මිද්දෙණිය |
| 235 | කරමැටිය | මිද්දෙණිය |
| 236 | තලාව උතුර | මිද්දෙණිය |
| 237 | තලාව දකුණ | මිද්දෙණිය |

# අඹුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## ගරු සභාපති තුමා, උපසභාපති තුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය



ගරු සභාපති
[illegible] මයා

27 [illegible]

071-8181828 (ජංගම)
047- 2248215 (නිවස)



ගරු උපසභාපති
[illegible] මයා

401 - B. [illegible]
අඹුණකොළපැලැස්ස

071-7254773 (ජංගම)
047-2228600 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

"[illegible]", [illegible]
අඹුණකොළපැලැස්ස

071- 4731732 (ජංගම)
047-2229038 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

"[illegible]", [illegible]

071- 8082775 (ජංගම)
047-5687482 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

[illegible],
අඹුණකොළපැලැස්ස

071-4234949 (ජංගම)
047-5687556 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

103 C, [illegible]

077- 5511286 (ජංගම)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

"[illegible]", [illegible]

071-3249894 (ජංගම)
047-4906908 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

[illegible]
අඹුණකොළපැලැස්ස

071- 7254757 (ජංගම)
047- 2228220 (නිවස)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

"[illegible]", [illegible]

072-8666587 (ජංගම)



ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
[illegible] මයා

2/646, [illegible]

071-9449230 (ජංගම)

# සම්බන්ධීකරණ තොරතුරු

ලිපිනය - අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව, අඟුණකොළපැලැස්ස

විද්‍යුත් තැපෑල - angupelessaps@gmail.com

වෙබ් - www.angunakolapelessa.ps.gov.lk

ෆැක්ස් - 047 - 2229022

දුරකතන අංක

කාර්යාලය - 047-2229023 / 047 - 2228275

ගරුසභාපති තුමා - 071 - 8181828 (ජංගම) / 047 - 2248215 (නිවස)

ලේකම් තුමිය - 071-7598217

| අංශය | දුරකතන අංකය | දිගුව | අංශය | දිගුව | දුරකතන අංකය |
|---|---|---|---|---|---|
| ගරුසභාපති තුමා | 047-4937090 | 700 | කාර්යාලීය මුරකුටිය | 712 | 047-4937100 |
| ලේකම් තුමා | 047-4937091 | 701 | විද්‍යුත් පුස්තකාලය | 703 | 047-4937093 |
| මූල්‍ය අංශය | 047-4937092 | 702 | පූරහල – කාර්යාලය | 704 | 047-4937094 |
| ආයතන අංශය | 047-4937096 | 706 | පුරහල – මුරකුටිය | 705 | 047-4937095 |
| සෞඛ්‍ය හා පරිසර අංශය | 047-4937097 | 708 | පිළිසරු ඒකකය | 714 | 047-4937102 |
| සැලසුම් හා නඩත්තු අංශය | 047-4937098 | 709 | කසාගල පුස්තකාලය | 715 | 047-4937103 |
| ප්‍රජා සේවා අංශය | 047-4937099 | 710 | තලාව පුස්තකාලය | 716 | 047-4937104 |
| පිළිගැනීමේ නිළධාරී | 047-4937101 | 713 | | | |




# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සංවිධාන ව්‍යුහය

# සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් / ආදේශක |
| 1 | ලේකම් | 1 | — | |
| 2 | සං.සහකාර | 9 | 10 | |
| 3 | ප්‍රජා සං.නි. | — | 1 | |
| 4 | තාක්ෂණ නිළධාරි(සිවිල්) | 1 | 1 | |
| 5 | කළ.ක.සහකාර | 6 | 6 | |
| 6 | පුස්තකාලාධිපති | 1 | — | |
| 7 | ආදායම් පරිපාලක | 1 | 1 | |
| 8 | පෙරපාසල් ගුරු | 1 | 2 | |
| 9 | රියදුරු | 7 | 7 | |
| 10 | විදුලි කාර්මික | 1 | 1 | |
| 11 | කාර්යාල කාර්ය සහායක | 1 | 1 | |
| 12 | මුරකරු | 2 | 3 | |
| 13 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 12 | 12 | 1 |
| 14 | පුස්තකාල සහායක | 3 | 5 | |
| 15 | සෞඛ්‍ය කම්කරු | 7 | 8 | 1 |
| 16 | රිය සහායක | — | 1 | |
| | | 53 | 59 | 2 |

## ආයතනය යටතේ පාලනයවන භෞතික සම්පත් සහ ආයතන

### භෞතික සම්පත්

- කාණු දිග අඩි 2525
- පොදු වැසිකිළි 04
- සුසාන භූමි 45
- තාර දැමූ මාර්ග දිග කි .මී. 20 35
- බොරළු දැමූ මාර්ග දිග කි. මී. 345
- කොන්ක්‍රීට් දැමූ මාර්ග දිග කි. මී 148
- සති පොළ 02
- විදි ලාම්පු 750
- නළ ළිං 79
- විදුලියෙන් ක්‍රියා කරන මෝටර් සහිත නළ ළිං 02

### ආයතන

- මහජන පුස්තකාල 03
- විද්‍යුත් පුස්තකාල 01
- ළමා උද්‍යාන 07
- ළදරු පාසල් 02




# සභාව සතු වාහන

| | | |
|---|---|---|
| 1. | කැබ් රථ | 2 |
| 2. | රෝද හතර ට්‍රැක්ටර් | 4 |
| 3. | ලීටර් 4000 බවුසර් | 4 |
| 4. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර | 2 |
| 5. | පුද්ගල ඔසවන | 1 |
| 6. | ලීටර් 5000 ලොරි බවුසර් | 1 |
| 7. | ත්‍රීවිල් රථ | 1 |
| 8. | අත් ට්‍රැක්ටර් | 1 |
| 9. | ජීප් රථ | 1 |
| 10. | ඩම්ප් ට්‍රක් | 1 |
| 11. | කෲ කැබ් | 1 |



අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

**ස්වයං උත්පාදිත ආදායම් විශ්ලේෂණය**




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 සැප්. දක්වා |
|---|---|---|---|---|---|
| අයවැයගත ස්වයං උත්පාදිත ආදායම(රු.මිලියන) | 8.87 | 15.06 | 14.45 | 17.94 | 18.14 |
| සත්‍ය ස්වයං උත්පාදිත ආදායම(රු.මිලියන) | 12.76 | 15.67 | 15.3 | 14.15 | 10.66 |



## ස්වයං උත්පාදිත ආදායමින් ප්‍රාග්ධන වියදම්

පසුගිය වසර 4ක ස්වයං උත්පාදිත ආදායමින් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිශතාත්මකව ප්‍රස්තාරානුසාරයෙන් පහත දක්වා ඇත. 2010 වර්ෂයේදී 32%ක් බඳු ඉහළ ප්‍රතිශතයක් පෙන්නුම් කළද 2011 වර්ෂයේදී 17%ක අගයකට පහත බසින ලද අගය, 2012 වර්ෂයේදී මෙන්ම 2013 වර්ෂයේදීත් ප්‍රාග්ධන වියදම් වෙන් කිරීම් ප්‍රතිශතය 22%ක මට්ටමක පවත්වාගෙන ගොස් ඇත.




ඉහත දක්වන ලද ස්වයං උත්පාදිත ආදායමින් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කිරීම් ඒ සඳහා වූ සත්‍ය වියදම හා සන්සන්දනය කිරීමේදී 2010 හා 2011 වර්ෂවලදී ආසන්න වශයෙන් 26% මට්ටමක පැවතුනි. කෙසේ වුවද මෙම වක්‍රය 2010 වසරින් පසු ක්‍රමිකව අඩුවෙමින් පහතට ගමන් කර ඇත. 2013 වර්ෂයේදී එය 7.62ක අවම මට්ටමක් දක්වා පහත ගොස් ඇත.




මෙම තත්වය බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා සභාවේ දායකත්වය වසරින් වසර අඩු වීමක් ලෙස පෙන්නුම් කළද, 2011 වර්ෂයෙන් පසුව ජාතික මට්ටමින් ලද අති විශාල මූල්‍ය අනුග්‍රහයන් යටතේ බල ප්‍රදේශයේ සංවර්ධන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් සංවර්ධන කාර්යයන් සඳහා ස්වයං උත්පාදිත ආදායම යොදා ගැනීම අඩුවී ඇත.

## ස්වයං උත්පාදිත ආදායමින් සේවක පඩිනඩි




අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාවේ ස්වයං උත්පාදිත ආදායමින් දළ වශයෙන් 25%ක් පමණ වැය වන්නේ සේවක වැටුප් හා දීමනා ගෙවීම සඳහාය. ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීම මෙහි ඇතුලත් නොවන්නේ එම වියදම් රජය විසින් ප්‍රතිපූර්ණය කරන හෙයිනි. සෑම වසරකම ඇස්තමේන්තුගත වියදමත් සත්‍ය වියදමත් අතර 2% - 5%ක විචලනයන් දක්නට ලැබෙන්නේ සේවා අවශ්‍යතාවය මත අනියම් සේවයේ යෙදවීම් හා නව බඳවා ගැනීම් මෙන්ම තාවකාලික කාර්ය මණ්ඩලය ස්ථිර සේවයට අන්තර්ග්‍රහනය වීමත් හේතුවෙනි.

## ස්වයං උත්පාදිත ආදායමින් වෙනත් පුනරාවර්තන වියදම්




පුද්ගල පඩිනඩි හැරුනු විට අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව විසින් උපයාගනු ලබන ස්වයං උත්පාදිත ආදායම වැඩි වශයෙන් යොදාගනු ලබන්නේ වෙනත් පුනරාවර්තන වියදම් සඳහාය. පුද්ගල පඩිනඩි හැරුනු විට සභාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන සැපයුම් හා සේවාවන් වෙනුවෙන් මෙකී වියදම් දැරීමට සිදු වේ. 2013 වර්ෂයේ සේවක ස්ථිර කිරීම් හේතුවෙන් පුද්ගල පඩිනඩි වෙනුවෙන් වෙන්කර තිබූ මුදල් ප්‍රමාණයක්ද යොදා ගැනීමෙන් වෙනත් පුනරාවර්තන වියදම් 10%ක ප්‍රමාණයකින් ඉහළ දැමීමට හැකිවී ඇත.




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 සැප්.දක්වා |
|---|---|---|---|---|---|
| ▪ ප්‍රාග්ධන වියදම් රු.මිලියන | 67 | 162 | 108 | 82 | 4 |

අඩු ආදායම් ලබන ප්‍රාදේශිය සභාවක් ලෙස අඟුණකොලපැලැස්ස ප්‍රාදේශිය සභාවේ ස්වයං උත්පාදිත ආදායම ඉතා අඩු මට්ටමක පැවතියද බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන්වලදී එම ආදායමට සාපේක්ෂව 200% - 400%ක ඉහල වියදමක් දරා ඇති බව පසුගිය වසරවල සංඛ්‍යා ලේඛන සාක්ෂි දරයි. විශේෂයෙන්ම බාහිරින් ලබාගන්නා ප්‍රාග්ධන ආධාර (මග නැගුම ව්‍යාපෘතිය, මන්ත්‍රී ප්‍රතිපාදන, පලාත් නිශ්චිත ප්‍රතිපාදන, වෙනත් යෝජනාක්‍රම ආදිය..) මගින් මෙම අති විශාල සංවර්ධන වැඩපිළිවෙල ක්‍රියාත්මක කෙරුනි. 2011 වසරේ සිට ප්‍රාග්ධන වියදම්වල අඩුවීමක් පෙන්නුම් කළද 2013 වසරේදිද රුපියල් මිලියන 82ක සංවර්ධන වැඩ යෝජනා ක්‍රියාත්මක කර ඇත. 2014 වර්ෂයේ මුල් කාර්තු 3 තුල ප්‍රාග්ධන වියදම් අඩු අගයක් පෙන්නුම් කර ඇත්තේ බාහිර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කටයුතුවලට අදාල මූල්‍ය ප්‍රතිපාදනවල ලැබීම්වල ප්‍රමාදය හේතුවෙනි.

අහුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

අයවැය සාරාංශය 2015

| | රු. | රු. |
|---|---|---|
| **පුනරාවර්තන ආදායම්** | | |
| පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 14203000 | |
| සෞඛ්‍ය සේවා | 2753000 | |
| භෞතික සැලසුම් ඉඩම්, මංමාවත් හා ගොඩනැගිලි | 6879000 | |
| වෙනත් උපයෝගී සේවා | 11550000 | |
| සුභ සාධක සේවා හා විහරණ | 2847000 | 38232000 |
| **ප්‍රාග්ධන ආධාර** | | |
| මන්ත්‍රී ප්‍රතිපාදන | 875000 | |
| පලාත් නිශ්චිත | 300000 | |
| මග නැගුම | 50000000 | 51175000 |
| | | 89407000 |
| **පුනරාවර්තන වියදම්** | | |
| පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 15334000 | |
| සෞඛ්‍ය සේවා | 3812000 | |
| භෞතික සැලසුම් ඉඩම්, මංමාවත් හා ගොඩනැගිලි | 8214000 | |
| වෙනත් උපයෝගී සේවා | 3890000 | |
| සුභ සාධක සේවා හා විහරණ | 3003000 | 34253000 |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | 300000 | |
| භෞතික සැලසුම් ඉඩම්, මංමාවත් හා ගොඩනැගිලි | 53275000 | |
| ණය වාරික ගෙවීම | 1178000 | |
| සුභ සාධක සේවා හා විහරණ | 400000 | 55153000 |
| | | 89406000 |
| **අතිරික්තය** | | 1000 |
| **ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය** | | |
| සභා අරමුදල් | | 3978000 |
| රාජ්‍ය/පලාත් සභා අරමුදල් | | 51175000 |
| | | 55153000 |

# අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## 2015 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු සාරාංශය

| වියදම් ශීර්ෂය | වැඩ සටහන් 01 පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | වැඩ සටහන් 02 සෞඛ්‍ය සේවා | වැඩ සටහන් 03 භෞතික සැලැසුම්,මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි | වැඩ සටහන් 05 පොදු උපයෝගි සේවා | වැඩ සටහන් 06 සුභ සාධක සේවා හා විහරණ | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| *පුනරාවර්තන ආදායම්* | | | | | | | |
| 10. වරිපනම් හා බදු | | 252000 | | | 5000 | 257000 | *0.67%* |
| 20. කුලී | | 315000 | 4003000 | 7810000 | 210000 | 12338000 | *32.27%* |
| 30. බලපත්‍ර ගාස්තු | 400800 | | 250000 | | | 650800 | *1.70%* |
| 40. සේවා සඳහා ගාස්තු | 621200 | | 6000 | | 45000 | 672200 | *1.76%* |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | 1500000 | | | 10000 | 10000 | 1520000 | *3.98%* |
| 60. වෙනත් ආදායම් | 645000 | 76000 | 20000 | 20000 | 2000 | 763000 | *2.00%* |
| 70. පුනරාවර්තන ආධාර | 11036000 | 2110000 | 4600000 | 1710000 | 2575000 | 22031000 | *57.62%* |
| පුනරාවර්තන ආදායම් එකතුව | 14203000 | 2753000 | 8879000 | 9550000 | 2847000 | 38232000 | *100.00%* |
| *ප්‍රාග්ධන ලැබීම්* | | | | | | | |
| 80. ප්‍රාග්ධන ලැබීම් | | | 51175000 | | | 51175000 | *133.85%* |
| ප්‍රාග්ධන ලැබීම් එකතුව | 0 | 0 | **51175000** | 0 | 0 | **51175000** | |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ලැබීම් එකතුව | 14203000 | 2753000 | 60054000 | 9550000 | 2847000 | 89407000 | |

# අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව
# 2015 වර්ෂයේ වියදම් ඇස්තමේන්තු සාරාංශය

| වියදම් ශිර්ෂය | වැඩ සටහන් 01 පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | වැඩ සටහන් 02 සෞඛ්‍ය සේවා | වැඩ සටහන් 03 භෞතික සැලැසුම්,මං මාවත් ඉඩම් හා ගොඩනැගිලි | වැඩ සටහන් 05 පොදු උපයෝගි සේවා | වැඩ සටහන් 06 සුභ සාධක සේවා හා විහරණ | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | | |
| 01. පෞද්ගලික පඩිනඩි | 11432000 | 2770000 | 4630000 | 1805000 | 2570000 | 23207000 | 67.75% |
| 02. ගමන් වියදම් | 661000 | 3000 | 10000 | 10000 | 5000 | 689000 | 2.01% |
| 03. සැපයුම් හා උපකරණ | 1331000 | 516000 | 1226000 | 1400000 | 225000 | 4698000 | 13.72% |
| 04. ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 475000 | 250000 | 850000 | 300000 | 75000 | 1950000 | 5.69% |
| 05. ප්‍රවාහන, සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1260000 | 161000 | | 235000 | 80000 | 1736000 | 5.07% |
| 06. පොලී ගෙවීම් හා ලාභාංශ | | | 1267000 | | | 1267000 | 3.70% |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 150000 | 80000 | 205000 | 103000 | 5000 | 543000 | 1.59% |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 25000 | 32000 | 26000 | 37000 | 43000 | 163000 | 0.48% |
| පුනරාවර්තන වියදම් එකතුව | 15334000 | 3812000 | 8214000 | 3890000 | 3003000 | 34253000 | 100.00% |
| **ප්‍රාග්ධන වියදම්** | | | | | | | |
| 09. ප්‍රාග්ධන වියදම් | 300000 | | 53275000 | | 400000 | 53975000 | 157.58% |
| 10. ණය වාරික ආපසු ගෙවීම් | | | 1178000 | | | 1178000 | |
| ප්‍රාග්ධන වියදම් එකතුව | 300000 | 0 | 54453000 | 0 | 400000 | 55153000 | |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් එකතුව | 15634000 | 3812000 | 62667000 | 3890000 | 3403000 | 89406000 | |
| අතිරික්තය | -1431000 | -1059000 | -2613000 | 5660000 | -556000 | 1000 | |

## වැඩ සටහන් අංක 01 - සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා

මෙම වැඩ සටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

ව්‍යාපෘති අංක 01 - පොදු පරිපාලනය

ව්‍යාපෘති අංක 02 - මූල්‍ය කටයුතු

ව්‍යාපෘති අංක 03 - තක්සේරු කිරීම් හා ආදායම් එකතු කිරීම

ව්‍යාපෘති අංක 04 - අභ්‍යන්තර විගණනය

ව්‍යාපෘති අංක 05 - කාර්ය මණ්ඩල අභිප්‍රේරණය

ව්‍යාපෘති අංක 06 - කාර්ය මණ්ඩල පුහුණු කිරීම

### 01. පොදු පරිපාලනය.

මේ යටතේ සභාව වෙත පැවැරී ඇති ව්‍යවස්ථාපිත බලතල, කාර්ය හා යුතුකම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී පනවනු ලබන ප්‍රතිපත්ති හා තීරණ නිසියාකාරව, අප්‍රමාදව හා අර්ථවත්ව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීමක් අපේක්ෂා කරනු ලබයි. එම අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම සඳහා,

1. සභාපති හා සභිකයින්ගේ පාලනය සඳහා ලේකම් සේවාව සැපයීම.
2. සභාවේ රැස්වීම් පිළියෙල කිරීම හා වාර්තා පවත්වා ගෙන යාම.
3. ලේඛනාගාරය පවත්වා ගෙන යාම සහ සභාවේ ලිපිගොනු, වාර්තා හා වෙනත් ලිපි ලේඛණ සුරක්ෂිතව තබා ගැනීම.
4. සේවක මණ්ඩල පාලනය, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පාලන කටයුතු.
5. සභාවේ සියලුම පරිපාලනමය හා විධායක කාර්යයන් නියම කිරීම, විධිමත් කිරීම හා පරිලෝචනය කිරීම.
6. සභාවේ සෑම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් කටයුතු කිරීම.
7. ප්‍රාදේශීය සභාවේ දේපළ ආරක්ෂාව හා භාරකාරත්වය නිසැක කිරීමට ක්‍රමයන් ඇති කිරීම.

### 2. මූල්‍ය කටයුතු

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය නම් මූල්‍ය පාලනයයි. සභාවේ සියලුම මූල්‍ය කටයුතු ඉටු කිරීම, පාලනය කිරීම හා ඒකාබද්ධ කිරීම ප්‍රධානතම කාර්යය වේ. භාවිතය සඳහා අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් තොග ගබඩා අවශ්‍ය වන්නේ නම් ඒවා පවත්වා ගෙන යාමේ හා පාලනය කිරීම් ආදි කටයුතු ඉටු කිරීම කරනු ලබයි. මේ යටතේ සිදුවන සේවාවන් මෙසේ විග්‍රහ කළ හැකිය.

1. අයවැය ලේඛනය පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම හා ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා සැපයීම.
2. ආදායම් ප්‍රතිපත්ති හා මුදල් සැපයුම් පරිපාලනය කිරීම.
3. ප්‍රාදේශීය සභා අරමුදල් පාලනය කිරීම.
4. ආදායම් හා වෙනත් ලැබීම් පිලිබඳ මධ්‍යගත පාලනය.
5. ගිණුම් ගත කිරීමේ ක්‍රම, කාර්ය සංවිධානය හා පාලන ක්‍රම ගිණුම් පොත් පවත්වා ගෙන යාම හා ගිණුම් ප්‍රකාශන පිලියෙල කිරීම.
6. බදු බාහිරාදිය මිලදී ගැනීම, එහි භාරකාරත්වය, ගෙවීම, බෙදා හැරීම පිළිබඳ මධ්‍යගත පාලනය කාර්ය මණ්ඩල වැටුප් හා පාරිශ්‍රමික දීමනා පිළියෙල කිරීම හා ගෙවීම් කිරීම.

### 3. තක්සේරු කිරීම හා ආදායම් එකතු කිරීම

මෙම අංශයට අයත් කාර්යය නම් නීතිමය විධි විධාන අනුව ප්‍රාදේශීය සභා ආදායම් අප්‍රමාදව හා ක්‍රමවත්ව එකතු කර ගැනීම සඳහා ගත යුතු සෑම පියවරක්ම ගැනීමට ක්‍රියා කරනු ලබන අතර, ඒ පිලිබඳ ලිපි ලේඛන පවත්වා ගෙන යාම හා සභාවට ආදායම් වැඩි දියුණු කර ගන්නා මාර්ගයන් සොයා බැලීම හා අවශ්‍ය නීති සම්පාදනය කිරීම වෙනුවෙන් ක්‍රියා කරනු ඇත.

www.angunakolapelessa.ps.gov.lk

## 4. අභ්‍යන්තර විගණනය

මෙම අංශයේ කාර්යයන් නම් බදු ගෙවන්නන් සහ සභාව වෙනුවෙන් පරිපාලනයේ සෑම අංශයක්ම පිරික්සීම හා විමර්ශනයට භාජනය කිරීමයි. පහත සඳහන් කාර්යයන් මෙහි ප්‍රධාන කොට සැලැකිය හැක.

1. ප්‍රාදේශිය සභාවේ අරමුදලට ලැබිය යුතු මුදල් නිසියාකාරව අයකරනු ලබන බව සොයා බැලීම.
2. වැරදි සහ වංචනික ක්‍රියා වැලැක්වීම සඳහා සියළුම ගිණුම් ඒකකයන් සම්බන්ධයෙන් කරනු ලබන අභ්‍යයන්තර ගිණුම් විගණනය සාර්ථක ලෙස කිරීම.
3. භාණ්ඩ පරිහරණය සහ කම්කරු ශ්‍රමය හරිහැටි උපයෝගි කරගන්නේ දැයි සොයා බැලීම.
4. නිදැල්ලේ ඇති සභාවේ වත්කම් නොපමාව විධිමත් භාරකාරත්වය යටතට ගැනිම හා අපතේ යන කම්කරු ශ්‍රමය හා ද්‍රව්‍ය නාස්තිය වැළැක්විමට කටයුතු කිරීම.

## 5. කාර්ය මණ්ඩල අභිප්‍රේරණය

කාර්ය මණ්ඩලය විසින් කරනු ලබන සේවාවන් අගය කිරීම, කාර්යක්ෂමව කැපවීමෙන් කරනු ලබන කාර්යයන් සඳහා ප්‍රසංශා කිරීම් හා ඒ පිළිබඳ සහතික හෝ ලිපි නිකුත් කිරීම තුළ කාර්ය මණ්ඩලයේ උදේ‍යාගය වැඩිවනු ඇත. මූලික පරමාර්ථය වන්නේ මානසික මට්ටම වැඩි දියුණු කිරීම තුළින් හොඳ සේවාවක් බලාපොරොත්තු වීමයි. එමෙන්ම කාර්ය මණ්ඩලයට හිමිවිය යුතු ස්ථානය, වරප්‍රසාද හා පාරිශ්‍රමික දීමනා වෙතොත් අප්‍රමාදව හා නොපිරිහෙළා ලබා දීම තුළ කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය වනු ඇත.

## 6. කාර්ය මණ්ඩල පුහුණු කිරීම.

උසස්ම නිලධාරියාගේ සිට පහළ කම්කරුවා දක්වා සේවය කරනු ලබන සියලුම සේවකයින්ට තම කාර්යය කෙසේ කළ යුතුද යන්න පිළිබඳ හා හොඳ සේවාවක් ඇති කර ගැනිමේ අදහසින් සේවක පුහුණුව මෙහි අරමුණයි.

www.angunakolapelessa.ps.gov.lk

## වැඩ සටහන් අංක 02 - සෞඛ්‍ය සේවා

මෙම වැඩ සටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වනු ලබයි.

01. රෝග වැලැක්වීමේ සේවාව.
02. රෝග සුව කිරීමේ සේවාව.
03. ආහාර හා සනිපාරක්ෂාව.
04. මළ බැහැර කිරීමේ සේවාව.
05. මාතෘ හා ළමා සායනය.
06. සෞඛ්‍ය අධ්‍යාපනය.
07. ඝන අප ද්‍රව්‍ය එකතු කිරීම හා ක්‍රමවත් බැහැරලීම.
08. වෙනත් සෞඛ්‍ය සේවා (සුසාන භූමි ඇතුලුව)

### 01. රෝග වැලැක්වීමේ සේවාව.

ප්‍රචාරක කටයුතු මගින් සනිපාරක්ෂක කටයුතු පරීලෝචනය කිරීම, බෝවන රෝග වසංගත හා පරිසරයේ හටගන්නා සනීපාරක්ෂාවට අහිතකර තත්වයන් නැති කිරීම හා සෞඛ්‍ය වර්ධනය ඇති කිරීම මීට අයත් වේ.

1. ලෙඩ රෝග වැලැක්වීම සඳහා නිතිරීති ක්‍රියාත්මක කිරීම, වෙළඳ ව්‍යාපාරික ස්ථාන ආදිය විධිමත් කිරීම හා විමධ්‍යගත පාලනය.
2. ජල භීතිකා රෝග නාශක ව්‍යාපාර පවත්වා ගෙන යාම.
3. විෂබීජ නාශක බෙහෙත් දියකර ඉසීම.
4. මීයන් වඳ කිරීමේ ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරීම.
5. එන්නත් කිරීම හා ප්‍රතිශක්තිකරණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම.

### 02. රෝග සුව කිරීමේ සේවාව.

නොමිලයේ වෛද්‍ය ප්‍රතිකාර සැලැස්වීමෙන්ද ලෙඩරෝග සුවකර ශාරීරික සෞඛ්‍ය පුනරුත්ථාපනය කිරීමෙන් මහජන සෞඛ්‍ය වර්ධනය මෙම සේවාවන්ට අයත් කාර්යයන් වේ.

### 03. ආහාර හා සනිපාරක්ෂාව.

මෙම සේවාවේ ප්‍රධාන කටයුතු පහත පරිදිවේ.

1. ආහාර හා ඖෂධ පනත ක්‍රියාත්මක කිරීම හා ආහාර පිළිබඳ සෞඛ්‍ය කටයුතු වලට අයත් හෝටල්, තේ කඩ , බත්කඩ, බේකරි සහ අප්‍රිය හා අනතුරු දායක යටතේ වන අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම.
2. ගෝ ඝාතක ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

### 04. මළ බැහැර කිරීමේ සේවාව.

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ වැසිකිලි නඩත්තු කිරීමත් ප්‍රාදේශීය ජනතාවගේ මළ බැහැර පද්ධති පවිත්‍ර කිරීමත් මෙමගින් සිදු කෙරේ.

### 05. මාතෘ හා ළමා සායනය.

මෙම සේවාව යටතේ ප්‍රධාන කාර්යයන් නම් ගර්භනි මව්වරුන්ගේ හා ළදරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම වේ. එයට අයත් ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. පූර්ව ප්‍රසුති හා පශ්චාත් ප්‍රසුති චිකිත්සාගාරයක් පැවැත්වීම.
2. සෞඛ්‍ය නිලධාරීන් මව්වරුන්ගේ නිවෙස් වලට ගොස් සෝදිසි කිරීම හා වෛද්‍ය උපදෙස් හා ආරක්ෂාව සලසා දීම.
3. නිවෙස් වලදි සිදුවන ප්‍රසුති සඳහා පහසුකම් හා ආධාර සැපයිම.
4. දිළිදු දරුවන්ට හා ගර්භනි මව්වරුන්ට ආහාර සහ ඖෂධ සැපයිම.
5. බෝවන රෝග වැලැක්වීම සඳහා ළදරුවන්ට ප්‍රතිශක්තිකරණය ලබාදීම.
6. පවුල් සංවිධාන චිකිත්සාගාර පැවැත්වීම.

### 06. සෞඛ්‍ය අධ්‍යාපනය

මෙම සේවාව යටතේ ප්‍රධාන කටයුතු නම් සිනමා දර්ශන මගින් සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම හා සෞඛ්‍ය සතිය පැවැත්වීම වේ.

### 7. වෙනත් සෞඛ්‍ය සේවා (සුසාන භූමි ඇතුලුව)

නගරයේ සෞඛ්‍යය ආරකෂා වන පරිදි ප්‍රදේශයේ වැසියන්ගේ හා අනාථ මළ සිරුරු භූගත කිරීම හා ආදාහන කටයුතු සදහා අවශ්‍ය පහසුකම් සපුරාලීම මෙම සේවාවේ අරමුණවේ.

www.angunakolapelessa.ps.gov.lk

## වැඩ සටහන් අංක 03 - භෞතික සැලැසුම් කිරීම්, මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි

ප්‍රාදේශීය සභාව සතු ඉඩම්, ගොඩනැගිලි මංමාවත් ක්‍රමවත්ව පවත්වාගෙන යාමත් අලුත්වැඩියාවන් හා අලුතින් එකතු කිරීමේ කටයුතුද ඇතුලුව ප්‍රාදේශීය සීමාව තුල ඉදිකරනු ලබන ගොඩනැගිලි පිළිබඳව ක්‍රමවත් වැඩ පිලිවෙලක් අනුව නාගර සංවර්ධන අධිකාරිය සමඟ එකමුතුව ක්‍රියා කිරීමයි.

මෙම වැඩ සටහනට අයත් පහත සඳහන් සේවාවන් ක්‍රියාත්මක වනු ලබයි.

1. නගර නිර්මාණය
2. මාර්ග, කාණු පාලම් හා බෝක්කු නඩත්තුව.
3. ඉඩම් හා ගොඩනැගිලි
4. මල්වතු හා උද්‍යාන

### 1. නගර නිර්මාණය

මෙම ව්‍යාපෘතිය යටතේ කෙරෙන ප්‍රධාන කටයුතු නම් ගොඩනැගිලි සැලැසුම් කිරීම පිළිබඳ සහ නගර නිර්මාණය යටතේ ක්‍රියාත්මක වැඩ පිලිවෙලක් වේ.

### 2. මාර්ග, කාණු, පාලම් හා බෝක්කු නඩත්තුව

මෙම සේවාව යටතේ කෙරෙන ප්‍රධාන කටයුතු නම් ප්‍රාදේශීය සභා සීමාව තුල පිහිටි සභාව සතු සියලුම පාරවල්, පටු මාවත්, කාණු හා බෝක්කු , පාලම්, ඇළ දොළ නඩත්තු කිරීම මෙමගින් සිදුවේ.

### 3. ඉඩම් හා ගොඩනැගිලි

මෙම සේවාවේ ප්‍රධාන කාර්යයන් නම් ප්‍රාදේශීය සභාව සතු ඉඩම්, ගොඩනැගිලි, නිවාස යෝජනා ක්‍රම, සාප්පු සංකීර්ණ, කඩ කාමර , පොදු වෙළඳ පොල ආදිය නඩත්තු කිරීම වේ. ප්‍රාදේශීය සභාව සතු ඉඩම් පාලනය කිරීම හා විධිමත් කිරීම, ප්‍රාදේශීය සභා ඉඩම් බදු දීම ආදිය වේ.

### 4. මල්වතු හා උද්‍යාන

මෙම සේවාව යටතේ වැදගත් කාර්යයන් නම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අලංකාරය පිණිස මල්වතු හා උද්‍යාන නඩත්තු කිරීම හා පාලනය කිරීමයි.

www.angunakolapelessa.ps.gov.lk

## වැඩ සටහන් අංක 05 - මහජන උපයෝගිතා සේවා

මහජන අර්ථකාර් සේවාවන් රැසක් මෙම වැඩ සටහන යටතේ ඉටු කරනු ලබයි. මෙම සේවාවන් ඒ ඒ සේවා අනුව මෙසේය.

1. වෙළඳ පොලවල්
2. පානීය ජලය සැපයීම
3. වීථි ආලෝකය
4. පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම
5. ක්‍රීඩා භූමි හා ප්‍රජා මධ්‍යස්ථාන

### 1. වෙළඳ පොලවල්

පොදු වෙළඳ පොල කළමණාකරණය කිරීම හා පවත්වා ගෙන යාම මෙහි ප්‍රධාන කාර්යය භාරයයි. පාරිභෝගිකයන් හා වෙළෙන්දන් අතර, පැහැදිලි සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාමෙන් පාරිභෝගිකයාට අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය පහසුවෙන් මිලදී ගැනිම හා ප්‍රමිතිවකින් යුක්තව ඒවා සැපයිමට හැකිවන අයුරින් එකි සම්බන්ධතාවය ගොඩනැගිම ප්‍රධාන පරමාර්ථය වේ. තවද මෙම පොදු වෙළඳ පොලවල් තුලින් ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධනයක් ඇති කිරීම ද අපේක්ෂා කරනු ලබයි.

### 2. පානීය ජලය සැපයීම

ජල සේවා වැඩසටහන ගිලිහී ගියද ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම වෙනුවෙන් හැකි සෑම උදව් උපකාරයක්ම ලබා දෙමින් ප්‍රදේශවාසීන්ගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම ප්‍රධාන කාර්යයි. ජල මූලාශ්‍ර නොමැති ප්‍රදේශවල සහ එමගින් ජලය සැපයීම බොහෝ වියදම් අධික කාර්යයක් වන අවස්ථාවන්හිදී නල ළිං ඉදිකර පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම තවත් කාර්යයකි.රට අමතරව පොදු ළිං ඉදිකර දීමටද ක්‍රියා කෙරේ.

### 3. වීථි ආලෝකය

මෙම සේවාවේ ප්‍රධාන කාර්යය නම් ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සෑම විදුලි කණුවකම දැල්වෙන විදුලි බුබුලු නියමිත වේලාවට දැල්වීම සහ නිවා දැම්මත් සුදුසු ස්ථාන වලට විදුලි බුබුලු සවි කිරීම හා ඒවා අලුත්වැඩියා කර නඩත්තු කිරීමයි.

### 4. පොදු නාන ස්ථාන පවත්වා ගෙන යාම

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රසිද්ධ නාන ස්ථාන පවත්වා ගෙන යාම සහ අලුත්වැඩියා කිරීම මෙයින් බලාපොරොත්තු වේ.

### 5.ක්‍රීඩා භූමි හා ප්‍රජා මධ්‍යස්ථාන

නිරෝගිමත් ජනතාවක් බිහි කිරීමේ අරමුණින් හා ශරීර වර්ධනය සඳහා සුවදායක සේවාවක් වශයෙන් ක්‍රීඩා කටයුතු සඳහා අනදීමේ අරමුණින් මහජන ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගන පවත්වාගෙන යාම ප්‍රධාන අරමුණු අතර වේ. ප්‍රදේශවාසීන්ගේ පොදු රැස්වීම්, සහභාගීවීම් හා වෙනත් පොදු කටයුතු සඳහා ප්‍රජා ශාලා ඉදිකර පවත්වාගෙන යාම තුළින් අධ්‍යාත්මික ගුණ වගාව, සමුහිකත්වය වර්ධනය වනු ඇත.

www.angunakolapelessa.ps.gov.lk

## වැඩ සටහන් අංක 06 - සුභ සාධක සේවා හා විහරණ

මහජන සුභ සාධනය වර්ධනය කිරීමට ඉවහල් වන අයුරින් දැනුම අවබෝධය හා අන්‍යෝන්‍ය එකමුතුව වර්ධනය වීම ආදිය සඳහා පහසුකම් සැලැස්වීම මෙම වැඩ සටහනේ ප්‍රධාන අරමුණයි.

මෙම වැඩ සටහන ද සේවාවන් කිහිපයක් යටතේ ක්‍රියාත්මක වේ.

1. පුස්තකාල සේවාව.
2. පරිසර වැඩසටහන්
3. විනෝද කටයුතු
4. පෙර පාසැල් පවත්වා ගෙන යාම

### 1. පුස්තකාල සේවාව

මෙම සේවාවේ ප්‍රධාන අරමුණ මහජනයාට පොත්පත්, වාර සඟරා, පුවත්පත් ආදිය පහසුවෙන් කියවීමට, බැහැර ගෙනයාමට හා එකී කරුණු ස්ථාපිත කර ගැනීමට සුදුසු ස්ථාන පිහිටුවා පවත්වාගෙන යාමට ක්‍රියා කිරීමයි.

මේ යටතේ ප්‍රාදේශිය සභාව මගින් පාලනය කරනු ලබන සාමාන්‍ය පුස්තකාල සේවාවට අමතරව නවීන තාක්ෂණයෙන් සමන්විත විද්‍යුත් පුස්තකාල සේවාවක්ද ආරම්භ කර ඇත.

### 2. පරිසර වැඩසටහන්

පාරිසරික සමතුලිතතාව රැක ගැනීම පිණිස කටයුතු කරයි. පරිසරය ආරක්ෂා කිරීම, දූෂණය අවම කිරීම ආදිය පිළිබඳ පුහුණු වැඩසටහන් පාසල මූලික කරගෙන පවත්වාගෙන යාම, පාරිසරික බලපත්‍ර නිකුත් කිරීම 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත(සංශෝධිත පනත්වලින් පැවරී ඇති බලතල) අනුව බලතල ක්‍රියාත්මක කිරීම.

### 3. විනෝද කටයුතු

විනෝද කටයුතු පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමෙන් මහජනතාවගේ මානසික සෞඛ්‍යය වර්ධනය සඳහා මං සැලසීම ප්‍රධන අරමුණ කරගෙන මෙම සේවාවන් පවත්වාගෙන යනු ලබයි.

### 4. පෙර පාසල් පවත්වා ගෙන යාම

ප්‍රාදේශිය සභාව විසින් පෙර පාසැල් පවත්වා ගෙන යනු ලබන අතර, එමගින් ප්‍රදේශයේ කුඩා දරුවන් වෙනුවෙන් වන බුද්ධි වර්ධනයේ ආරම්භය සභාව විසින් අරඹා ඇත.

www.angunakolapelessa.ps.gov.lk

වැඩ සටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා යටතේ ඇස්තමේන්තු කර ඇති පුනරාවර්තන ආදායම් ප්‍රභවයන් ...

*__වාහන බලපත්‍ර ගාස්තු (බයිසිකල් බලපත්‍ර ගාස්තු) -1.1.35__*

*ප්‍රාදේශීය සභා පනතේ 147 (1) (අ) වගන්තිය ප්‍රකාර වාහන හා සතුන් පිළිබඳ බද්දක් අයකළ හැකි බවට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව එම පනතේ හතරවන උප ලේඛනය අනුව මෙසේ අයකළ යුතු වාර්ෂික බදු ප්‍රමාණයන් නියම කර ඇත. එහි බයිසිකලයක් සඳහා අය කළ යුතු මුදල රු. 4.00 ක් ලෙස දැක්වේ. පසුගිය වර්ෂ කිහිපයක මේ විෂය යටතේ එකතු වූ ආදායම හා බල ප්‍රදේශය තුළ බයිසිකල් භාවිතය අවම වීම සැලකිල්ලට ගෙන 2015 වර්ෂයට මේ විෂය යටතේ රු. 800.00ක් ආදායමක් ලෙස ඇස්තමේන්තු කර ඇත.*

*__ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, කටවුට් හා පෝස්ටර් සඳහා ගාස්තු 1.3.36__*

*ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය සභාව වෙත ඇත. ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, කටවුට් හා පෝස්ටර් දැන්වීම් ආදියෙන් ගාස්තුවක් අයකිරීමට සභාව විසින් ඒට අදාල අතුරු ව්‍යවස්ථා මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇත. 2015 වර්ෂයේද මේ සඳහා අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පහතින් දැක්වේ. මෙම ගාස්තු ප්‍රමාණයන් පදනම් කර ගෙන ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම්, කටවුට් හා පෝස්ටර් සඳහා ගාස්තු අය කිරීම මගින් 2015 වර්ෂයට රු.400,000.00 ක ආදායමක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.*

*1. තාවකාලික මාස 01ට අඩු දැන්වීම් පුවරු/බැනර් සඳහා ව.අඩි 01කට රු.10 බැගින්*
*2. මාසයකට වැඩි, ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ව.අඩි 01ට රු.50 බැගින්*

*__සේවා සඳහා ගාස්තු - 40__*

*සභාව විසින් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් ගාස්තුවක් අය කරනු ලබයි. මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වටිනාකමින් 1%ක් පරිපාලන වියදම් ලෙස අය කර ගැනීමට ක්‍රියා කරයි. ඒ අනුව මෙම සභාව විසින් පහත සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් මෙසේය.*

| | |
|---|---|
| 01. පරීක්ෂණ හා සහතික කිරීමේ ගාස්තු | 200000.00 |
| 02. නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 20000.00 |
| 03. විශේෂ ගාස්තු(වාහන බලපත්‍ර සඳහා) | 1200.00 |
| 04. විශේෂ ගාස්තු(කර්මාන්තවලින් පරිපාලන වියදම්) | 400000.00 |

*1. පාපැදියක් ලියාපදිංචි කිරීම වෙනුවෙන් අය කරනු ලබන පරිපාලන වියදම් රු. 6.00*

*2. නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමට රු. 500.00*

*3. ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කිරීම වෙනුවෙන් හා සහතික කිරීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු:*

| වර්ග මීටර් | නේවාසික රු. | වෙළඳ හා වෙනත් රු. |
|---|---|---|
| 45 ට අඩු | 500.00 | 310.00 |
| 46- 90 | 1500.00 | 450.00 |
| 91-180 | 25000.00 | 600.00 |
| 181-270 | 3500.00 | 800.00 |
| 271-450 | 4500.00 | 2100.00 |
| 451-675 | 5500.00 | 3100.00 |
| 676-900 | 7500.00 | 5100.00 |
| 901-1225 | 7500.00 | 12000.00 |

*ඉහත ශීර්ෂයන් යටතේ සේවා සඳහා ගාස්තු වශයෙන් සියලු ලැබීම් 2014 වර්ෂයට රු.733,000.00ක මුදලක් ඇස්තමේන්තු කර ඇත.*

www.angunakolapelessa.ps.gov.lk

උසාවි දඩ - 1.5.52

ප්‍රාදේශීය සභා පනත මෙන්ම වෙනත් අණපනත් ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම නීතිය ක්‍රියාත්මක වීම තුලින් උසාවිය විසින් අයකර ගන්නා වූ දඩ මුදල් වලින් ප්‍රාදේශීය සභාව වෙත ලැබෙයයි අපේක්ෂිත ආදායම උසාවි දඩ ආදායම යටතේ ඇස්තමේන්තු කර ඇත. පසුගිය වර්ෂ කිහිපයක ලැබී ඇති උසාවි දඩ ආදායම සැලකිල්ලට ගනිමින් 2015 වර්ෂය වෙනුවෙන් උසාවි දඩ වශයෙන් රු. 1,500,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

වෙනත් ආදායම් - 1.6.60.

ස්ථාවර තැන්පත් යටතේ අපේක්ෂිත පොලී ආදායම රු.5,000.00ක් ද, වැඩ සටහන් 01 යටතේ වන ආකෘති හා පෝරම ආදිය විකිණීමෙන් ලැබෙන ආදායම රු.10,000.00ක් ද, සභා සේවකයින් වෙනුවෙන් ලබා දී ඇති සේවක ණය පොලිය ආදායමක් ලෙස රු.80000.00ක් ද,වෙනත් විකිණීම් වශයෙන් රු.50000.00ක්ද මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

ඊට අමතරව ප්‍රදේශයේ සංවර්ධනයත් සමඟ සිදුවන ඉඩම් ගනුදෙනු කිරීම තුලින් මුද්දර ගාස්තු ආදායමක් ලෙස 2015 වර්ෂයේ රු.500000.00 ක් ද ඇස්තමේන්තු කර ඇත.

ආදායම් ආධාර - 1.7.71

මෙම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 61 ක් වන අතර, වැඩ සටහන් අංක 01 යටතේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 26 කි.

2015 වර්ෂය වෙනුවෙන් සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රු.9,146,000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

සභාපති ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දීමනා ප්‍රතිපූර්ණය ලෙස සභාවට ලබා ගැනීමට අපේක්ෂිත මුදල රු.1,890,000.00 කි.

# අහුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව

## 2015 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු

| වැඩ සටහන් 01 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා | | | | |
